**දිවුලපිටිය ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 අභිතකර මතය**

දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට දිවුලපිටිය ප්‍රාදේශීය සභාව මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 අභිතකර මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අභිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් ආදායම 2021 වර්ෂයට අදාළව රු.19,163,956 ක් සහ 2022 වර්ෂයට අදාළව රු.31,783,132 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 දෙසැම්බර් 31 දිනට අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | ක්ෂය වටිනාකම 2021 වර්ෂයේදී රු.19,502,929 ක් සහ 2022 වර්ෂයේදී රු.32,767,990ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පුස්තකාල පොත් වටිනාකම රු.15,436,837 ක් දේපල පිරියත සහ උපකරණ ලෙස ගිණුම්ගත කරනු වෙනුවට, ජංගම වත්කම්හි තොග ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද පුස්තකාල පොත්වලට අදාලව ක්ෂය වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සභාවට අයිති නොවන ඉඩම්වල ඉදිකර තිබූ එකතු වටිනාකම රු.1,882,816 ක් වූ ඉදිකිරීම් 4 ක්, 2021 වර්ෂයේදී දේපළ පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

### 1.6.2. නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 04 ක ශේෂ එකතුව, මූල්‍ය ප්‍රකාශන අනුව රු.57,836,945 ක් වුවද උපලේඛන අනුව රු.52,456,132 ක් වූයෙන් රු.5,380,813 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි කරමින් පවතින බව. | වෙනස් කම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

### 1.6.3. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.30,148,923 ක් වටිනා ගිණුම් ශේෂ 08 ක් ඒවාට අදාළ මූලික උපයෝගී ලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | 2023.12.31 ගිණුමෙන් නිවැරදි කරන බව. | ලේඛන සකස් කළ යුතුය. |

### 1.7. අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරු කරන ආඥා පනත වගන්ති අංක 20 | උප කාර්යාල 2 ක 2004 වර්ෂයේද එක් උප කාර්යාලයක 1994 වර්ෂයේ තක්සේරුවද පදනම් කරගෙන වරිපනම් අයකරනු ලබයි. | තක්සේරු ප්‍රතිශෝධනය සඳහා දේපළ 18,000 ක ප්‍රමාණයක් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති බව. | තක්සේරුව කරවාගෙන, නව වරිපනම් රේට අනුව අය කල යුතුය. |
| (ආ) | අංක 2155/8 හා 2019 දෙසැම්බර් 24 දින අති විශේෂ ගැසට් පත්‍රය මගින් පනවා ඇති බස්නාහිර පළාත් ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග | | | |
| | අංක 83(ii) | ප්‍රාදේශීය සභා නිලධාරීන් හා සේවකයන් ගෙවිය යුතු සේවක ණය සඳහා වෙනම අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2023 වර්ෂයේ සිට ගිණුමක් පවත්වාගෙන යන බව. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි | | | |
| | (i) 371 | 2006 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අත්තිකාරම් ලෙස ලබාදී තිබුණු රු.2,793,113 ක් 2023 | අය කර ගැනීමට ඇති අත්තිකාරම් අය කර ගන්නා බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | මාර්තු 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | | |
| (ii) 571 | වසර 2 ඉක්මවූ රු.334,894 ක් නියාදනය කර නොතිබුණි. | ආදායමට ගැනීමට කටයුතු කරන බව. | -එම- |

(ඈ) චක්‍රලේඛ

| | | | |
|---|---|---|---|
| 2016 නොවැම්බර් 09 දිනැති අංක LGD/13/2016 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු (බස්නාහිර පළාත) චක්‍රලේඛය | ගිවිසගත් දිනෙන් සෑම වසර 03 කට වරක් මාසික කුලිය ප්‍රතිශෝධනය විය යුතු වුවුත් කඩ කාමර 20 ක් සඳහා 2014 වර්ෂයේ තක්සේරුව මත කුලී අය කරමින් පැවතුණි. | තක්සේරු ප්‍රතිශෝධනය සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට භාර දී ඇති බව. | තක්සේරුව කරවාගෙන, නව රේට අනුව කුලිය අය කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.230,033,227 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.48,140,427 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1. ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 14,269,791 | 15,636,473 | 15,268,512 | 457,961 | 15,367,940 | 15,237,903 | 13,477,792 | 2,625,303 |
| (ii) | කුලී | 7,218,558 | 7,126,474 | 7,003,131 | 59,448 | 7,331,320 | 4,304,767 | 5,668,293 | 1,742,647 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,804,000 | 1,977,584 | 1,977,584 | | 1,801,686 | 1,297,068 | 2,071,574 | |
| (iv) | වෙනත් ආදායම් | 9,992,613 | 13,614,636 | 13,614,636 | | 65,778,930 | | 88,997,309 | |
| | | 33,284,962 | 38,355,167 | 37,863,863 | 517,409 | 90,279,876 | 20,839,738 | 110,214,968 | 4,367,950 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිවුලපිටිය ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරන ආදාහනාගාර 2 සඳහා 2023 මාර්තු මස 31 වන විටත් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | ආදාහනාගාර සඳහා බලපත්‍ර ගැනීමට මේ වන විට කටයුතු ආරම්භ කර ඇති බව. | බලපත්‍ර ලබා ගත යුතුය. |

### 3.2. මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ දේපල සමීක්ෂණය අනුව වරිපනම් අයකළයුතු දේපල සංඛ්‍යාව 16,260 ක් ලෙස හඳුනාගෙන තිබුණද දේපල 2,774 කින් පමණක් වරිපනම් අයකර තිබුණි. | තක්සේරු කිරීම ආරම්භ කර ඇති බව. | තක්සේරුව ලබාගෙන නව වරිපනම් රේට අනුව වරිපනම් අය කල යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට වෙනත් ණයගැති ශේෂය රු. 11,684,854 ක් විය. | අයකර නොගත් මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව . | ණයගැති ශේෂ අයකරගත යුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට වියදම් ණය හිමි ශේෂය රු. 33,148,658 ක් විය. | මුදල ගෙවා නිම කිරීමට කටයුතු කරන බව. | ණය හිමි ශේෂ ගෙවිය යුතුය. |

### 3.3. වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.6,569,000 ක් වූ දේපළ 9 ක් 2022 භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගෙන නොතිබුණි. | සාධන පත්‍ර මඟින් ප්‍රාදේශිය සභාව වෙත පවරා දී ඇති බව. | ගිණුම්ගත කර ඇති ඉඩම් හඳුනා ගත යුතුය. |
| (ආ) | සභාව සතු ඉඩම් 2 ක අනවසර ඉදිකිරීම් සිදුකර තිබුණි. | පරීක්ෂා කර වාර්තාවක් ලබා දීමට කටයුතු කරන බව. | දේපළ.නිවැරදි වටිනාකමට ගිණුම්ගත කිරීම සහ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම කළයුතුය. |
| (ඇ) | සභාව සතු දේපලවල වැට මායිම් සකස්කර නොතිබුණු බවත්, සුසාන භූමි වල්බිහිවී තිබුණු බවත්, නාම පුවරු නොතිබුණු බවත් ළිං බොහොමයක් භාවිතයේ නොතිබුණු හා ගරා වැටී වල්බිහිවී තිබුණු බවත් නිරීක්ෂණය විය. | සභාව සතු ඉඩම් වල නාම පුවරු සවි කිරීමද වැටවල් සකස් කිරීමද ආරම්භ කර ඇත. සුසාන භූමි ශුද්ධ පවිත්‍ර කරන බව. | දේපළ කාලීනව නඩත්තු කල යුතුය. |

### 3.4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාන මාරුවී ගිය, මිය ගිය, විශ්‍රාම ගිය සේවය හැර ගිය නිලධාරීන් 19 දෙනෙකුගෙන් රු.391,710 ක සේවක ණය 2023 මාර්තු 31 දිනවන විටත් අයකරගෙන නොතිබුණි. | අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | සේවක ණය අය කළ යුතුය. |